**<u>හදිසි හා ඉතා වැදගත්</u>**

PPSC/EX/2/2/16/2019
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.
2020. 08. 15

ප්‍රධාන ලේකම් (වයඹ),
ආණ්ඩුකාරවර ලේකම් (වයඹ),
සභා ලේකම් (වයඹ),
වයඹ පළාතේ සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ආයතන ප්‍රධානීන් වෙත.

**<u>වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් වයඹ පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2019 (2020 (අභ්‍යන්තර විභාග නිවේදනය සංශෝධනය කිරීම)</u>**

උක්ත විභාගය සම්බන්ධ මගේ සමාංක හා 2020.07.31 දිනැති අභ්‍යන්තර විභාග නිවේදනය හා බැඳේ.

එහි 8.0 (ii) වගන්තිය හා 8.0 (vi) වගන්තිය, එකිනෙක අතර පරස්පරතාවයක් පවතින බැවින් ඉහත අභ්‍යන්තර විභාග නිවේදනය සහ අයදුම්පත්‍රය සංශෝධනය කොට යළි නිකුත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

- අභ්‍යන්තර විභාග නිවේදනයේ සංශෝධිත වගන්ති හා ඊට අදාළ අංක පහත දැක්වේ.

8.0 (vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසන් දිනය වන **2020.08.24** වැනි දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

9.0 (ඇ) අයදුම්පත්‍රය නිවැරදිව ද පැහැදිලිව ද අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්අකුරින්ම සම්පූර්ණ කොට සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් **2020.08.24** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, බී දොරටුව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"**යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

10.0 අයදුම්පතේ අගට යොදා ඇති අන්දමේ සහතිකයක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව ලිවිය යුතුය. යම් අයදුම්කරුවකු/අයදුම්කාරියක මෙම ක්‍රියාපිළිවෙත අනුගමනය කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ/ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය. **2020.08.24** වැනි දිනට හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කිරීම සඳහා ස්වකීය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත කල් ඇතුව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන් /අයදුම්කාරියන් වෙත දන්වා සිටිනු ලැබේ. විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවැති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාල වන අතර අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

- විභාග අයදුම්පත්‍රයේ සංශෝධිත වගන්ති හා ඊට අදාළ අංක පහත දැක්වේ.

5.12 දැනට දරන තනතුරේ සේවා කාලය (**2020.08.24** වැනි දිනට) :- ........................................

<u>**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**</u>

3. ඔහු/ඇය ස්ථිර තනතුරක **2020.08.24** වැනි දින වන විට සේවයේ ස්ථිර කරනු ලැබ සිටින බවද,
5. ඔහු/ඇය **2020.08.24** වැනි දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවද,
7. ඔහු/ඇය **2020.08.24** වැනි දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවද,

<u>**සැලකිය යුතුයි:-**</u>

මේ වන විටත් අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.
සංශෝධිත අභ්‍යන්තර විභාග නිවේදනය සහ අයදුම්පත්‍රය මේ සමඟ අමුණා ඇත.

වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී.බී. වික්‍රමසිංහ,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020.08.15
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
පළමු මහල,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.